# සමූපකාරය



**අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මෙන්ම කෘෂිකර්මය සඳහා අවශ්‍ය යෙදවුම් වැනිදෑ බෙදාහැරීම, කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම, ණය පහසුකම් සැපයීම ආදී කටයුතුවලදී ගැමි ජනතාව වෙනුවෙන් මහැඟි සේවාවක් සමූපකාරය මගින් සැලැසෙයි.**

ශ්‍රී ලංකාවේ සමූපකාර ව්‍යාපාරය ඇරඹුණේ 1911 දී එවක යටත් විජිත ආණ්ඩුව විසින් සමූප-කාර ණය දෙන සමිති ආඥා පණත නීති ගත කිරීමත් සමඟ ය. එහෙත්, එම ව්‍යාපාරය පුළුල් අන්දමින් දිවයින පුරා සංවිධාන කිරීමට පටන් ගත්තේ දෙවැනි ලෝක සංග්‍රාමය සමයේ දී කලුකඩ වෙළඳාමෙන් ජනතාව බේරා ගැනීම සඳහා අත්‍ය-වශ්‍ය ද්‍රව්‍ය සාධාරණ ලෙස ජනතාව අතරෙහි බෙද හැරීමේ අරමුණ ඇතිව ය. සමූපකාර සමිති මගින් තම කාර්යය ඉතාමත් සාර්ථක ලෙස ඉටු කරන ලද හෙයින් ජන ජීවිතය යළි පණ ගැනීම සඳහා එම ව්‍යාපාරය බෙහෙවින් ප්‍රයෝජනවත් වන බව එවක ආණ්ඩුවට වැටහී ගියේ ය. ඒ අනුව, ගොවීන්ට කලට වේලාවට ණය සහ කෘෂිකාර්මික යෙදවුම් ලබා ගැනීම සඳහාත්, පෞද්ගලික වෙළෙඳුන් ගේ ග්‍රහණයට හසු නොවී ඔවුන් ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීම සඳහාත් 1947 දී කෘෂි නිෂ්පාදන සහ අලෙවි සමූපකාර සමිති පිහිටුවීමේ වැඩ පිළිවෙළක් සකක් කෙරිණි.

1957 වන විට එවැනි සමිති 2,126 ක් රට පුරා සංවිධානය කර තිබිණි. එම වසරේදී ම එවක සමූපකාර ඇමතිවරයා විසින් හැම ගමක් සඳහා ම විවිධ සේවා සමූපකාර සමිතිය බැගින් පිහිටුවීමේ

ප්‍රතිපත්ති තීරණයකට එළැඹුණු අතර එම වැඩ පිළිවෙළ යටතේ පාරිභෝගික අවශ්‍යතාවන් සැපයීමත්, ණය මෙන් ම වෙනත් කෘෂිකාර්මික යෙදවුම් බෙදු දීම සහ කෘෂි නිෂ්පාදන අලෙවිය සංවිධානය කිරීමත් එකී සමිති මගින් බලාපොරොත්තු විය. ඒ අනුව, සමූපකාර කඩ සමිති සහ ගොවි ද්‍රව්‍ය නිෂ්පාදන හා අලෙවි සමූපකාර සමිති බොහොමයක් ම විවිධ සේවා සමූපකාර සමිති බවට පරිවර්තනය කරන ලදී. කෙසේ වෙතත්, 1965 වන විට සමූපකාර කඩ සමිති සංඛ්‍යාව 755 ක් දක්වා ද, ගොවි ද්‍රව්‍ය නිෂ්පාදන හා අලෙවි සමූපකාර සමිති සංඛ්‍යාව 589 දක්වා ද අඩු වී තිබුණු අතර, විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව 5,053 දක්වා ඉහළ ගොස් තිබිණි.

### රාජකීය කොමිසම

සමූපකාර ව්‍යාපාරයේ සංවිධාන රටාවෙහි ප්‍රධාන වෙනස්කම් ඇති කිරීමට පටන් ගත්තේ සමූපකාර ව්‍යාපාරය පිළිබඳව සොයා බැලීම සඳහා පත් කරන ලද රාජකීය කොමිසමේ නිර්දේශ මත ය. 1970 දී සමූපකාර කොමසාරිස්වරයා වෙත පවරන ලද විශේෂ බලතල ප්‍රකාර ආර්ථික වශයෙන් ලාභදායී නොවන සහ අභාවයට ගිය සමිති 1,000 ක පමණ ලියා පදිංචිය අහෝසි කොට සෙසු සමිති ඒකරාශී කිරීමෙන් ප්‍රාදේශීය මට්ටමේ විවිධ සේවා සමූපකාර සමිති 372 ක් ඇති කරන ලදී. ස්වාධීන තනි සමිති ප්‍රාථමික සමිතිවල ශාඛා බවට පත් විය. සාමාජිකත්වය වැඩි කිරීම සඳහාත්, සාමූහික ක්‍රියාකාරිත්වය වර්ධනය කිරීම සඳහාත් එක් එක් සාමාජිකයා විසින් ගෙවිය යුතු සාමාජික මුදල රුපියල් 50 සිට රුපියල දක්වා අඩු කරන ලදී.

1971 දී දිස්ත්‍රික් මට්ටමේ ද්විතීයික සමිති අහෝසි කරන ලද අතර, එවක ක්‍රියාත්මක වූ විවිධ සේවා සමූපකාර 5,818 යළි ප්‍රතිසංවිධානය කොට ගම් මට්ටමේ ශාඛා 10,000 ක් පමණ ඇති ප්‍රාථමික මට්ටමේ විවිධ සේවා සමූපකාර සමිති 327 ක් ඇති කරන ලදී. පසුව, සමිති තව දුරටත් ඒකාබද්ධ කිරීම වැනි කටයුතු නිසා 1976 වන විට විවිධ සේවා සමූපකාර සමිති සංඛ්‍යාව 310 ක් පමණ වූ අතර, සාමාජික සංඛ්‍යාව 17,00,000 ද ඉක්මවා තිබිණි. දැනට ක්‍රියාත්මක වෙන මෙම සමිති සංඛ්‍යාව 272 ක් පමණ වේ. 1976 දී දිවයින පුරා සමූපකාර සිල්ලර වෙළඳ සැල් 7,000 කට වැඩි ප්‍රමාණයක් පිහිටුවා තිබිණි. දිවයිනේ මුළු ජනගහණයෙන් සියයට 85 කට පමණ අවශ්‍ය සලාක ද්‍රව්‍ය සහ වෙනත් අත්‍යවශ්‍ය පාරිභෝගික භාණ්ඩ ද එම වෙළඳසල් මගින් බෙදු හරින ලදී.

### ප්‍රතිසංවිධානය

වත්මන් රජය බලයට පත්වූ පසුව සමූපකාර ක්‍රමය යළි ප්‍රතිසංවිධානය කිරීමේ අරමුණ ඇතිව සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා කොමිටියක් පත් කරන ලදී. එම කොමිටියේ එක් විශේෂ නිර්දේශයක් වූයේ සමූපකාර ක්‍රමය මහජන ව්‍යාපාරයක් බවට පත් කිරීම සඳහා මහජන ඡන්දයෙන් ම තෝරා ගත් අධ්‍යක්ෂ මණ්ඩල ඒවා පාලනය කිරීම සඳහා පත් කර ගත යුතුය යන්නය. ඒ අනුව, දිවයින පුරා සමූපකාර සඳහා ඡන්දයෙන් තෝරා ගන්නා ලද අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීමට ආහාර හා සමූපකාර අමාත්‍යාංශය මගින් විධි විධාන යොදන ලදී. සමූපකාරවලට උපදෙස් දීම සඳහා ජාතික සමූපකාර මණ්ඩලයක් පත් කිරීම, සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ඊට පමණක් සීමා වූ දෙපාර්තමේන්තුවක් බවට පත් කිරීම, සමූපකාර බැංකුවක් ඇති කිරීම, සමූපකාර රක්ෂණ සංගමයක් ඇති කිරීම, සමූපකාර වල ගණන් හිලව් බැලීම සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් පිහිටුවීම ආදිය කොමිටියේ වෙනත් වැදගත් යෝජනා අතර විය.

ග්‍රාමීය සංවිධාන අතුරෙන් ඉතාමත් කැපී පෙනෙන ආයතනයක් වන සමූපකාරය අත්‍යාවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය මෙන් ම කෘෂිකර්මයට අවශ්‍ය යෙදවුම් වැනි දෑ බෙදු හැරීම, කෘෂි නිෂ්පාදන අලෙවි කිරීම, ණය පහසුකම් සැපැයීම ආදී කටයුතු බොහොමයක දී ගැමි ජනතාව වෙනුවෙන් මා හැඟි සේවාවක් ඉටු කරන 'ජනතා සංවිධානයකි.